www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බරපතල ආහාර හිඟය හා මිල ඉහල යාම් ලෝක ජනගහනයට තර්ජනය කරයි

## Severe food shortages, price spikes threaten world population

**නයෝමි ස්පෙන්සර් විසිනි**
**2007 දෙසැම්බර් 22.**

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ (එෆ්ඒඕ) මෑත ම ආහාර විවරනයට අනුව මෙම වසර තුල ආහාර මිල ගනන් තියුනු ලෙස ඉහල නැගී අතර සැපයුම පහත වැටී තිබේ. දෙසැම්බර් 17 වන දින ආයතනය අනතුරු ඇඟවූයේ මෙම වෙනස්කම් පෙන්නුම් කරන්නේ "පෙර නොදුටු විරූ හා පෙර නොවූවිරූ" ගෝලීය ආහාර පද්ධතියේ මාරුවීමක් බවත් එය කෝටි ගනනකට ආහාර දුලබ වීමේ හා සාගතයේ තර්ජනය එල්ල කරන බවත්ය.

එෆ්ඒඕ හි ආහාර මිල දර්ශකය පසු ගිය වසරේ සියයට 9 කින් ඉහල යෑමට වැඩිමනත්ව, මෙම වසර තුල සියයට හතලිහකින් ඉහල නැඟුනි. දුගී ම රටවල් ආනයනික ආහාර සඳහා මෙම වසර තුල සියයට විසිපහක් වැඩිපුර වැය කර තිබේ. තිරිඟු, සහල්, බඩඉරිඟු, සෝයා බෝංචි වැනි ප්‍රධාන බෝගවල මිල ගනන් 2007 වසර තුල තියුනු ලෙස ඉහල නැඟුනි. මෙයට අනුකූලව ධාන්‍ය පෝෂිත මාංශ, කිරි, බිත්තර ඇතුලු ගොවිපල නිෂ්පාදිතයේ මිල ගනන් ඉහල ගියේ ආහාර පාරිභෝගික වෙලඳපොල පුරා උද්ධමනය අවුලුවා ලමිනි.

මෙම උද්ධමනයට හේතු කාරක වූ සංකීර්න වර්ධනයන් මාලාවක් හඳුනාගෙන ඇත. ජනගහනයේ වේගවත් නාගරික කරනය, චීනය හා ඉන්දියාව වැනි සංවර්ධනය වන මූලික රටවල ආහාර සඳහා ඉල්ලුම ඉහල යෑම, භාන්ඩ වෙලඳපොලෙහි සමපේක්ෂනය, සත්වාහාර බෝග වඩ වඩාත් ජීව ඉන්ධන නිෂ්පාදනය සඳහා යොදා ගැනීම, ආන්තික දේශගුනික තත්වයන් හා දේශගුනික වෙනස්කම්වලට සම්බන්ධ අනෙකුත් ස්වාභාවික විපත් ඒ අතර වේ.

මෙම සාධක සියල්ලෙහි දිගු කාලීන හා සම්මිශ්‍රිත ස්වභාවය නිසා ම, ආහාර පද්ධතියේ පහත වැටෙන සැපයුම හා ඉහල නඟින මිල ගනන් සම්බන්ධ ගැටලු තාවකාලික හෝ එක් කාලයකට හටගන්නා දේ ලෙස නොසැලකෙන අතර, ඉල්ලුමේ හා සැපයුමේ චක්‍රීය උච්චාවචනයන් ලෙස අවබෝධ කර ගැනීමට ද නොහැකිය.

ලෝකයේ ධාන්‍ය සංචිත පිරිහෙමින් තිබේ. පසුගිය වසරේ පමනක් තිරිඟු තොග සියයට 11 කින් පහත වැටුනි. එෆ්ඒඕ සඳහන් කලේ එක්සත් ජාතීන් වාර්තා තබාගැනීමට පටන් ගත් 1980 වසරේ පටන් වාර්තාගත පහල ම මට්ටම එය බවයි. එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට (යූඑස්ඩීඒ) අනුව ලෝක තිරිඟු තොග වසර 47 කට පසු පහලම මට්ටමට වැටී තිබේ.

2008 ජූනි මාසයෙන් අවසන් වන මුදල් වර්ෂය තුල යූඑස්ඩීඒ බලාපොරොත්තු වන තිරිඟු අපනයනවලින්, සියයට 90 ක් එක්සත් ජනපද තිරිඟු නිෂ්පාදකයන් විසින් දැනටමත් විකුනා අවසන් බවට දෙපාර්තමේන්තුව අනතුරු අඟවා ඇත. එක්සත් ජනපදය හා අනෙකුත් ප්‍රධාන නිෂ්පාදකයන් වෙතින් ආනයනය කරන ධාන්‍ය වර්ග බොහෝ කොට ම ආහාරයට ගන්නා ලෝකයේ දුප්පත්ම ජනතාව කෙරෙහි මෙමඟින් දරුනු ප්‍රති විපාක ඇති කල හැකිය.

ලෝක ජනගහනයෙන් මිලියන 850 ක් දරුනු සාගින්නෙන් හා ආන්තික දරිද්‍රතාවයේ අනෙකුත් ආපදාවලින් පීඩා විඳිති. එෆ්ඒඕ අනුව අප්‍රිකාවේ 20 ක් ද, ආසියාවේ 9 ක් ද, ලතින් ඇමරිකාවේ 6 ක් ද, නැඟෙනහිර යුරෝපයේ 2 ක් ද වශයෙන් ලෝකයේ රටවල් 37 ක් දැනට ආහාර නිෂ්පාදනයේ හා සැපයුමේ බැරෑරුම් හිඟයන්ට මුහුනපා සිටියි.

බලපෑමට වැඩියෙන් ම හසුව ඇත්තේ ආහාර ආනයනය මත රැඳී පවතින රටවල්ය. සිය ආහාර වේල මුලුමනින් ම පාහේ ධාන්‍යවලින් සැදුම් ලත් දුගීම ජනතාව මෙයට පහසුවෙන් ම ගොදුරු වේ.

එෆ්ඒඕ අනුව සිය ආදායමෙන් වැඩි කොටස ප්‍රධාන ආහාර සඳහා - සමහර කලාපවල මෙය සියයට 80 ක තරම් ඉහල මට්ටමක පවතී - වැය කිරීම දුගීබවේ ලක්ෂනයක් වී ඇත. නිතිපතා ඉහල නඟින මිලගනන් ජනගහනයේ මෙවන් කොටස්වල ආහාර රටාවේ කැපීපෙනෙන පිරිහීමකට තුඩුදිය හැකිය.

ආහාර අර්බුදය සමාජ අසහනය තීව්‍ර කරන අතර සමාජ කැලඹීම්වල ඉඩ කඩ වැඩි කරයි. මොරොක්කෝ, උස්බෙකිස්ථාන්, යේමන්, ගයනා, මොරිටේනියා හා සෙනගාල් යන රටවල වර්ධනය වී ඇති දේශපාලන කැලඹිලි "ආහාර වෙළඳපොලට ඍජුව ම සම්බන්ධ" බව එෆ්ඒඕ සඳහන් කරයි. පසුගිය වසර තුල ඉරිඟු පිටි මිල සියයට හැටකින් ඉහල යෑම නිසා මෙක්සිකෝවේ ද, තවත් බොහෝ රටවල ද ධාන්‍ය මිල කැරලි ඇවිලී යාමට තුඩුදුන්නේය. පැස්ටා මිල ඉහල යෑම ඉතාලිය පුරා විරෝධතාවන් අවුලුවා ලීය. පිසින තෙල් හිඟය චීනයේ කලබල හටගැනීමට හේතු විය.

ආනයන වියදම්වලට අමතරව, යුද්ධය හා සිවිල් අරගල, වසර ගනනාවක් පවතින නියගය හා අනෙකුත් ව්‍යසනයන් හා එච්අයිවී/ඒඩ්ස් රෝගවල බලපෑම රටවල්වල ආහාර සැපයුම් යාන්ත්‍රනයන් කඩාකප්පල් කර තිබේ.

එක්සත් ජනපද ආක්‍රමනය හා මිලිටරි ග්‍රහනය හේතුකොට ගෙන ඉරාකය හා ඇෆ්ගනිස්ථානය යන දෙරටෙහි ම දරුනු හිඟයන් අතිව තිබේ. ප්‍රධාන ආහාර බොහොමයකට ආනයනික තිරිඟු අවශ්‍ය වන බැවින් ඉහල යන තිරිඟු මිල උතුරු අප්‍රිකානු රටවලට බෙහෙවින් බලපා තිබේ.

පැරනි සෝවියට් සංගමයේ රටවල් තිරිඟු හිඟයකට මුහුන දෙයි. ජනතාව සිය ආදායමෙන් සියයට හැත්තෑවක් තරම් ආහාර සඳහා වැය කරති. මෙම වසර තුල කිර්ගිස්ථානයේ පාන් මිල සියයට 50 න් ඉහල නැගුනු අතර තාවකාලිකව, අර්බුදය සමනය කිරීම සඳහා ආන්ඩුව දුප්පත්ම ප්‍රදේශවලට හදිසි තිරිඟු සංචිත මුදා හැරියේය.

බංග්ලාදේශයේ ජූලි මාසයේ සිට සෑම මසකට වරක්ම ආහාර මිල සියයට 11 න් ඉහල නැගුනි. පසුගිය වසර තුල හාල් මිල සියයට 50 න් පමන ඉහල ගොස් ඇත.

මධ්‍යම ඇමරිකානු රටවල ප්‍රධාන ධාන්‍ය වන ඉරිඟුවල මිල සියයට 50 න් ඉහල ගොස් තිබේ. ජාතික ආන්ඩුවලට ආනයනික තීරු බදු ඉවත් කිරීමට බල කෙරෙමින්, ඉහල නැගුනු ජාත්‍යන්තර තිරිඟු මිල බොහෝ දකුනු ඇමරිකානු රටවලට බලපා තිබේ. නිදසුනක් ලෙස බොලීවියාව කාර්මික පරිමානයේ බේකරි ඇරඹීම සඳහා මිලිටරිය යොදවා තිබේ.

බරපතල ආහාර හිඟය හෝ සාගත තත්වයකදී සිවිල් අරගල පැනනැඟීමේ හැකියාව පිලිබඳව සෑම ජාතික ආන්ඩුවක්ම අවධානයෙන් පසුවෙති. බොහොමයක් කෙටිකාලීනව අර්බුදය සමහන් කිරීමට ආනයනික තීරුබදු අඩුකිරීම හා අපනයන සීමාවන් පැනවීම වැනි පියවර ගෙන තිබේ. දෙසැම්බර් 20 වන දින චීනය දේශීය හිඟය පියවාගැනීමේ උත්සාහයක නිරත වෙමින් ආහාර අපනයන සඳහා දී තිබුනු දිරිගැන්වීම් අත්හිටුවීය. රුසියාව, කසාක්ස්ථානය හා ආර්ජන්ටිනාව ද අපනයන සීමාවන් පැනවීය.

එහෙත් එවන් ප්‍රතිපත්තීන් අහාර පද්ධතියේ අර්බුදයට කිසිදු සැලකිය යුතු විසඳුමක් සැපයීමට අසමත්වී ඇත්තේ ඒවා සමීප ව්‍යාධීන්ට මිස රෝග කාරකයට පිලියමක් වී නැති බැවින්ය. උද්ධමනය පිටුපස ඇත්තේ ගෝලීය වෙළඳපොලවල සංකීර්න අන්තර් බැඳීම් හා කෝටි සංඛ්‍යාත වැඩ කරන හා දුගී ජනතාවගේ අවශ්‍යතාවන් සමඟ ධනේශ්වර පද්ධතියේ මූලික නොපෑහීමයි.

ව්‍යාපාරවස්තු හා නය වෙළඳම ද සමපේක්ෂනය ද මඟින් දුවවනු ලබන මූල්‍ය වෙළඳ පොලවල අවිනිශ්චිත භාවය, කෘෂිකාර්මික භාන්ඩ වෙළඳපොල මත ඍජුව ම පදනම්ව ඇති වෙළඳපොලවල අනාගතය හා විකල්පයනට හරස්ව පිහිටා ඇත. එක්සත් ජනපද නිවාස වෙළඳපොල බිඳ වැටෙන විට නය වෙළඳපොලෙහි පැනනැඟි ගැටලු අවපාතයක තර්ජනය එල්ල කරන අතර, සමපේක්ෂනය භාන්ඩ වෙළඳපොලට මාරුවූයේ මූලික භාන්ඩ හා අමුද්‍රව්‍ය මත උද්ධමනකාරී පීඩනය උග්‍ර කරමිනි. වර්තමාන මිලගනන් කෙරෙහි අනාගත පාරිභෝගික මිලගනන් පිලිබඳ සමපේක්ෂනය දැඩිලෙස බලපාන බැවින් ජාත්‍යන්තර ආහාර වෙළඳපොල විශේෂයෙන්ම අස්ථාවරත්වයට නැමියාවක් දක්වයි. මෙම සමපේක්ෂනය නිසා අස්ථාවරත්වය තවත් වැඩිවිය හැකි අතර එමඟින් සමපේක්ෂනය තවත් දිරිගන්වයි.

අනාගත ධාන්‍ය මිල මෙම ව්‍යසනකාරී චක්‍රය පිලිබඳ තවත් සිත් කාවදින නිදසුනකි. දෙසැම්බර් 17 වන දින, 2008 මාර්තුවල බෙදාහැරීම සඳහා ඇති සහල් හා තිරිඟු වල චිකාගෝ වෙළඳ මන්ඩලයේ මිල ගනන් ඓතිහාසික මට්ටම් කරා ඉහලට තල්ලු කලේය. නරක අතට හැරෙන හිඟය හා උද්ධමනය පිලිබඳ ගනන් බැලීම් මත තිරිඟු බුසලක මිල ඩොලර් 10 කටත් වැඩියෙන් ඉහල ගියේය. මෙය 2007 ආරම්භයේදී තිරිඟු බුසලක ඩොලර් 5 ක්ව තිබූ මිල මට්ටම දෙගුන වීමකි.

දෙසැම්බර් 19 වන දින ආසියාවේ විශාලතම තිරිඟු ආනයනකරුවා වන ජපානය තිරිඟු මිල සියයට 30 න් ඉහල දමනු ඇතැයි නිවේදනය කලේය. එදින ම ඉන්දීය ආන්ඩුවේ නිලධාරීන් ආහාර ආරක්ෂනයේ සමීපතම ගැටලු ගැන අනතුරු ඇඟවීය. අගමැති මන්මෝහන් සිං ට අනුව, මෙම ගැටලු පැන නගින්නේ "අඩු වරප්‍රසාදිත නය අර්බුදයට පසු ගෝලීය මූල්‍ය වෙළඳපොලවල අඳුරු වලාවන්" හේතු කොට ගෙන ය.

අපේක්ෂිත හිඟය හා ජීව වායු සඳහා ඉල්ලුම මත සෝයා බෝංචි හා ඉරිඟු මිල පිලිවෙලින් වසර 34 හා 11 වසරකට පසු ඉහලම මට්ටමට ලඟාවිය.

වෙළඳමේ මෙම නව මට්ටම්, පසුව කෙරෙන වෙළඳමේ ප්‍රමිතියව තිබේ. දෙසැම්බර් 17 වන දින ෆිනෑන්ෂල් ටයිම්ස් පත්‍රය සඳහන් කල පරිදි ''ඉහල යන උද්ධමනකාරී පීඩනය හා ආර්ථික පහල බැසීම පාලනය කර ගැනීමට මධ්‍යම බැංකුවලට ඇති හැකියාවේ සීමාසහිත කම නිසා '' ප්‍රති විපාක දරුනුවේ.

විශේෂයෙන් ම තම ප්‍රධාන අහාර විශාල පරිමානයෙන් ආනයනය කරන ජාතීන්, අවසාන වශයෙන් ඉන්ධන වියදම් ඉහලයාමේ ප්‍රතිපල ලෙස අධික නැව් ගාස්තු හරහා ඉහල ආහාර මිල ගනන්වලට මුහුන පා සිටිති. බෝල්ටික් හුවමාරුවේ ඩ්‍රයි දර්ශකය අනුව භාන්ඩ තොග සඳහා නැව් ගාස්තු පසුගිය වසරේ සියයට 80 න් ද මෙම වසරේ ජූනි සිට සියයට 57 න් ද වැඩිවී තිබේ.

එෆ්ඒඕ සඳහන් කලේ, ප්‍රවාහන පිරිවැය විශාල ලෙස වැඩිවීම හේතු කොට ගෙන බහුලව ආනයනය කරන රටවල් ආසන්නම සැපයුම් කරුවාගෙන් මිලට ගැනීමට ඇති හැකියාව මත කටයුතු කිරීම නිසා ''ලෝක මට්ටම්වලට අනුකූල නොවන අයුරින් ප්‍රාදේශීය හෝ ස්වදේශීය මිල මට්ටම් පහල වැටීමට පටන්ගෙන තිබීම'' ලෝක වෙළඳපොල නිශ්චිත කලාපයන් තුලදී බිඳී විසිරී යාමට තුඩුදිය හැකි බවය.

ඉහල යන ඉන්ධන මිල ගනන් බලපා ඇත්තේ ප්‍රවාහන හා ආනයන වියදම් කෙරේ පමනක් නොවේ. ගොවිපල කටයුතුවල දී යොදාගන්නා කෘෂිකාර්මික හා කාර්මික සැකසුම් යන්ත්‍ර පිරිවැය මතද එමගින් ඍජු බලපෑමක් ඇතිකර තිබේ. තවද, අනෙකුත් ඉන්ධන පිරිවැය හා ඉල්ලුම මත ඉහල යන තෙල් මිල ගනන්වල බලපෑම නිසා ස්වාභාවික ගෑස්වලින් ලබාගන්නා නයිට්‍රජන් ප්‍රධාන සංරචකයක් කොට ගන්නා පොහොර මිල ද සීග්‍රයෙන් ඉහල නැග ඇත. ඒ අර්ථයෙන්ම ගත්කල තෙල් මිල ඉහල යද්දී, ඉරිඟු, උක් දඬු හා සෝයා බෝංචි වැනි ජීව වායු මූලාශ්‍රයන් සඳහා ඉල්ලුම ද වැඩිවීමේ ප්‍රතිපල වශයෙන් ඉන්ධන හා අතිරේක නිෂ්පාදන සඳහා යොදාගන්නා ආහාර භෝග තොගය ද ඉහල නගියි.

එක්සත් ජනපදය තුල එතනෝල් නිෂ්පාදනය සඳහා ඉරිඟු යොදාගැනීම 2003 පටන් මේ වනවිට දෙගුන වී තිබේ. එෆ්ඒඕ ගනන් බැලීම් අනුව 2016 වනවිට මෙය මෙට්‍රික් ටොන් මිලියන 55 සිට මිලියන 110 දක්වා ඉහල නගිනු ඇත. එක්සත් ජනපද ආන්ඩුව මෙයට දැඩි උනන්දුවක් දක්වයි. දෙසැම්බර් 19 වන දින ජනාධිපති බුෂ් නව ඉන්ධන පනතක් නීතිගත කිරීමට අත්සන යෙදීය. ඒ අනුව ඉදිරි 15 වසර තුල දේශීය ජීව වායු නිෂ්පාදනය පස් ගුනයකින් එනම් වසරකට ගැලුම් බිලියන 36 කටත් වඩා පුලුල් කිරීම සඳහා එමගින් ඉඩ සැලසේ. දැනටමත් එක්සත් ජනපද ඉරිඟු අස්වැන්නෙන් තුනෙන් එකක් එතනෝල් නිෂ්පාදනය සඳහා යොදාගැනෙන අතර එය ලෝක ආහාර වෙළඳපොලට නිකුත් කරන ඉරිඟු ප්‍රමානය ඉක්මවයි.

එක්සත් ජනපදයේ වගාබිම් වඩ වඩාත් එතනෝල් ආශ්‍රිත ඉරිඟු සඳහා යොදාගන්නා තත්වය තුල අනෙකුත් ප්‍රධාන කෘෂිකාර්මික කලාප දේශගුනික විපර්යාස සමග බැඳී ඇති දේශගුනික ව්‍යසනයන් සමග පොර බදයි. ඕස්ට්‍රේලියාව හා යුක්රේනය යන සැලකිය යුතු තිරිඟු අපනයනකරුවන් දෙදෙනා ම වගාවන් විනාශ කල ආන්තික දේශගුනික තත්වයෙන් පීඩා විඳීය. දකුනු ඕස්ට්‍රේලියාවේ කාලයක් පවතිනා නියඟය, බොහෝ ගොවීන් සිය ඉඩම් විකුනා දමන පරිමානයකට වගාවන් සීමා කලේය.

නවතම පර්යේෂනවලට අනුව එලඹෙන වසර පනහ තුල වසරකට සෙල්සියස් අංශක 1-2 අතර උෂ්නත්වයේ ඉහල නැගීමක් අපේක්ෂිත ය. වර්ෂාපතනය අඩුවීම නිසා දුප්පත් රටවලට සරුසාර ඉඩම් හෙක්ටෙයාර් දශ ලක්ෂ 135 ක් හෙවත් අක්කර දශලක්ෂ 334 ක් අහිමි වනු ඇත. මෙම මාසයේ මුල ප්‍රකාශයට පත් කරන ලද විද්‍යාවන් පිලිබඳ ජාතික ඇකඩමියේ අලුත්ම වාර්තාවලට අනුව ඉහත තක්සේරුව පවා අධි ශුභවාදී යයි අනතුරු ඇඟවූ අතර ආහාර නිෂ්පාදනයෙහි ලා දේශගුනික විපර්යාසවල බලපෑම උවමනාවට වඩා සරල කර තිබේ යයි සඳහන් කරයි.

නාසා/ගොඩාඩ් අභ්‍යවකාශ අධ්‍යයන ආයතනයේ පර්යේෂක ටියුබිලෝට අනුව ලෝක ආහාර සැපයුමෙහි ලා දේශගුනික විපර්යාසයන්ගේ ඇඟවීම් කලින් පුරෝකථනය කලාට වඩා බෙහෙවින් නරක විය හැකිය. "ප්‍රක්ෂේපනයන් පෙන්වන්නේ සුමුදු වක්‍රයකි, එහෙත් වක්‍රය ඉතිහාසයේ කවර කලෙකවත් සුමුදු වූයේ නැත. සිදුවීම් හදිසියේ හටගනියි, එවිට ඒවාට ප්‍රතිචාර දැක්වීමට ඔබට නුපුලුවන."

2003 ඉතාලියේ ඉරිඟු වගාව පිලිබඳ කාරනයේ දී මෙන් වගාවේ පැල හටගන්නා හා මල්පල ගන්නා කාලයට ආන්තික දේශගුනික සිදුවීම් සම්පාත වුව හොත් සමස්ත වගාව ම විනාශ වීමේ අවදානම කෙරෙහි ටියුබිලෝ ගේ අධ්‍යයනයෙන් අවධානය යොමුකර තිබේ. ඉතාලියේ පෝ ගංගා නිම්නයේ ඉරිඟු අස්වැන්න, දිගුකාලීන සාමාන්‍යයට වඩා ඉතාලියේ උෂ්නත්වය අංශක 6 කින් ඉහල නැංවූ ඌෂ්න වායු ධාරාවෙන් පසුව සියයට 36 න් පහල වැටුනු බව ටියුබිලෝ සඳහන් කරයි.

පැලෑටිවල පැවැත්ම එලිපත්තට ම පැමින තිබෙනවාට අමතරව, සර්ම කලාපවලට ආවේනික වෛරස් වර්ග, වසංගත හා අනෙකුත් රෝග කාරක පැතිර යාම මෙන්ම, ගොවිපල සත්ව වෛරස් රෝග හා සතුන්ගේ දේහ කාය කෙරෙහි ඉහල උෂ්නත්වයේ

බලපෑම ගැන පර්යේෂකයන්, අධ්‍යයනය කිරීම ආරම්භ කර තිබේ. ගොඩාඩ් පර්යේෂන ආයතනය සඳහන්කර ඇත්තේ හරකුන්ට හා බැටලුවන්ට සෑදෙන බ්ලූටං නමැති වෛරස් රෝගය සර්ම කලාපයෙන් පිටත දකුනු ඕස්ට්‍රේලියාව ඇතුලු කලාපවලට පැතිර යා හැකි බවය. කොලොම්බියා විශ්ව විද්‍යාලයේ මිහිකත ආයතනයට අනුව ඉහල උෂ්නත්වය සතුන්ගේ වඳ භාවය වැඩිවීමටත් ගොවිපල අස්වැන්න අඩුවීමටත් හේතුවනු ඇත.

මෙම අධ්‍යයනයන්හි ඇඟවුම් වන්නේ ඔරොත්තු දීමේ ශක්තිය වැඩි භෝග හා වගාකරන කාල සීමාවන් මාරුකිරීම වැනි වගා ක්‍රම, ආරම්භයේදී අපේක්ෂිත ගෝලීය උනුසුම් වීමේ සැර බාල කලහැකි නමුත් එලඹෙන දශකවල දී ආහාර සැපයුම කෙරෙහි දේශගුනික වෙනස්කම්වල බලපෑම ධනේශ්වර පද්ධතිය හා එහි පාලක පන්තීන් කිසි සේත් ම සූදානම් නොමැති හා ඒ නිසා ම වලක්වා ගනීමට අසමත් ආකාරයකට හදිසියේ හා ව්‍යසනකාරී ලෙස උත්සන්න කෙරෙනු ඇත.

© www.wsws.org